I වන පරිශිෂ්ඨය

## තනතුරකට පත්කිරීමේ/ තනතුරෙහි ස්ථිර කිරීමේ/ තනතුරක උසස් කිරීමේ ක්‍රමවේදය

1. කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් මිස, කිසිදු පත්කිරීමක් එම පත්කිරීමට අදාල තනතුරට නියමිත බඳවා ගැනීමේ පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව, සිදු නොකළ යුතු ය.

2. කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සියළුම තනතුරු පුරප්පාඩු, කොමිෂන් සභාව විසින් හෝ රජයේ ප්‍රතිපත්තියට අනුව, අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටිවල වෙනත් අයුරකින් දක්වා නොමැති විට, දැන්වීමක් මඟින් ප්‍රසිද්ධ කළ යුතු ය.

   කරුණු එසේ වුවද, යම් තනතුරක ශ්‍රේණියකට හෝ පන්තියකට බඳවා ගැනීම, බඳවා ගැනීමේ පරිපාටියට අනුව, එම තනතුරේ ශ්‍රේණියකට හෝ පන්තියකට උසස් වීමක් මඟින් සිදු කරන විට, එකී උසස් වීම අදාල තනතුරේ උපරිම වැටුප් පියවරේ යම් නිශ්චිත සේවා කාලයක් සපුරාලීමෙන් පසු ගත කරනු ලැබූ විට සහ තනතුරේ උසස් වීමට අදාල නිශ්චිත කොන්දේසි සපුරාලීමෙන් පසුව හෝ සිදු කිරීමට අවසර දී ඇති විට, එසේ උසස් කිරීම දැන්වීමක් ප්‍රසිද්ධ කිරීමෙන් තොරව සිදු කළ හැකි ය.

3. යම් තනතුරකට අදාල බඳවා ගැනීමේ ක්‍රමවේදයට අනුව, එම තනතුර සඳහා ප්‍රථම අවස්ථාවේ දී, අභ්‍යන්තර අයදුම්පත් කැඳවීම අවශ්‍යතාවයක් වූ අවස්ථාවන්හි දී, එසේ තනතුර වෙනුවෙන් අභ්‍යන්තරව ප්‍රසිද්ධ කරන්නා වූ දැන්වීම, කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සහ සෑම උසස් අධ්‍යාපන ආයතනයන්/ විද්‍යායතනයන් අතරේ එකම අවස්ථාවක දී බෙදා හැරිය යුතු ය.

4. **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරක් සඳහා වූ තේරීම් කමිටුවක සංයුතිය**

   4.1 විශ්වවිද්‍යාලයක්/ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක්

   පනතෙහි X වන කොටසෙහි දක්වා ඇති ප්‍රතිපාදනයන්ට යටත් ව, විශ්වවිද්‍යාලයක/ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක සෑම ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරකම පත්කිරීමක් හෝ උසස් කිරීමක් පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත තේරීම් කමිටුවක් මඟින් සිදු කරන ලද නිර්දේශයන්ට අනුව, එම විශ්වවිද්‍යාලයේ/ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයේ පාලක බල මණ්ඩලය විසින් සිදු කළ යුතු ය.

   (i) විශ්වවිද්‍යාලයේ උපකුලතිවරයා/ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්

   (ii) කොමිෂන් සභාව විසින් පාලක බල මණ්ඩලයට පත් කරනු ලැබූ පාලක බල මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු

   (iii) අදාල පීඨයේ පීඨාධිපතිවරයා

   (iv) අදාල අධ්‍යයනාංශයේ, අංශාධිපතිවරයා

   (v) අවස්ථාවෝචිත පරිදි, සනාථන සභාව/ ශාස්ත්‍රීය කමිටුව විසින් නම් කරනු ලැබූ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් දෙදෙනෙකු හෝ සමාන තනතුරු හොබවන වෘත්තිකයන් දෙදෙනෙකු. මෙම අයවලුන්ගෙන් එක් අයෙක් අදාල විශ්වවිද්‍යාලයෙන්/ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයෙන් බාහිර තැනැත්තන් විය යුතු ය.

කරුණු එසේ වුවද;

(අ) තනතුර සඳහා අයදුම්කොට ඇත්තේ අධ්‍යයනාංශ ප්‍රධානියා ම නම් හෝ එම අධ්‍යයනාංශයේ ස්ථිර අංශාධිපතිවරයකු මේ වන විට නොමැති නම් හෝ සනාථන සභාව / ශාස්ත්‍රය කමිටුව විසින්, අදාල විෂය සම්බන්ධයෙන් දැනුමැති තම සාමාජිකයින් අතුරින් තෝරා ගත් සාමාජිකයකු, එම අංශාධිපතිවරයා වෙනුවට තේරීම් කමිටුවට පත් කළ යුතු වේ.

(ආ) තනතුර සඳහා අයදුම් කොට ඇත්තේ, අදාල පීඨයේ පීඨාධිපතිවරයා නම්, අවස්ථාවෝචිත පරිදි සනාථන සභාව / ශාස්ත්‍රීය කමිටුව විසින්, පීඨාධිපතිවරයා වෙනුවට වෙනත් සුදුසු තැනැත්තෙකු පත් කළ යුතු වේ.

(ඇ) තනතුර සඳහා විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා හෝ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක අධ්‍යක්ෂවරයා අයදුම්කරුවකු ලෙස ඉදිරිපත් වී ඇති විට, අදාල කරුණ සම්බන්ධයෙන් සාකච්ඡාවන සෑම සනාථන සභා/ශාස්ත්‍රීය කමිටු රැස්වීමකින්ම එම උපකුලපතිවරයා/ අධ්‍යක්ෂවරයා ඉවත්විය යුතු අතර, එවැනි අවස්ථාවලදී, එකී කරුණු සාකච්ඡා කිරීම සඳහා, පාලක බල මණ්ඩලය විසින් එම රැස්වීම සඳහා තාවකාලික (pro-tem) සභාපතිවරයකු පත් කරනු ඇත.

ඒ සමගම අදාල තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම සඳහා වෙනත් බාහිර ආයතනයක තැනැත්තෙකු කොමිෂන් සභාව විසින් පත් කරනු ඇත.

සටහන :

1. මෙහි ඉහත 4.1 උපඡේදයෙහි සඳහන් නියමයන්, *අවශ්‍ය වෙනස්කම් කිරීමට යටත්ව*, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුටකට පත් කිරීමකට/ උසස් කිරීමකට ද අදාල වේ.

2. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ද ඇතුළු ව ඉහත සඳහන් තනතුරක, තනතුරෙහි ස්ථිර කිරීම සඳහා වන තේරීම් කමිටුව, මෙහි 4.1 උපඡේදයෙහි සඳහන් තේරීම් කමිටුවේ (i), (ii), (iii) සහ (iv) හි සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු වේ. මෙම නියමය කුසලතා පදනම මත තනතුරට උසස් වූ තැනැත්තන් කෙරෙහි බලපවත්වන්නේ නැත.

4.2 ආයතනයන්

පනතෙහි X වන කොටසෙහි දක්වා ඇති ප්‍රතිපාදනයන්ට යටත්ව, ආයතනයක ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරක් සඳහා සිදුකරන්නා වූ සෑම පත් කිරීමක් හෝ උසස් කිරීමක් පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත තේරීම් කමිටුවක නිර්දේශය මත, එම ආයතනය අනුබද්ධිතව පවතින විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සිදු කළ යුතු ය.

(i) ආයතනය අනුබද්ධිතව ඇති විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා, තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්.

(ii) ආයතනයේ අධ්‍යක්ෂවරයා. ආයතනයේ අධ්‍යක්ෂවරයා තනතුර සඳහා අයදුම්කොට ඇති විට, ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් අතුරින් තෝරා ගත් එක් සාමාජිකයකු අධ්‍යක්ෂවරයා වෙනුවට කොමිෂන් සභාව විසින් තේරීම් කමිටුවට නම් කරනු ඇත.

(iii) ආයතනය අනුබද්ධිතව ඇති විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ සාමාජිකයින් දෙදෙනෙකු. මෙම සාමාජිකයින් දෙදෙනා, කොමිෂන් සභාවෙන් අදාල පාලක සභාවට පත්කල සාමාජිකයින් විට යුතු ය.

(iv) ආයතනය අනුබද්ධිතව පවත්නා විශ්වවිද්‍යාලයේ සනාථන සභාව විසින් නම් කරනු ලැබූ, අදාල පීඨයේ පීඨාධිපතිවරයකු

(v) සනාථන සභාව මඟින් නම් කරනු ලැබූ ජ්‍යෝෂ්ඨ මහාචාර්යවරුන් දෙදෙනෙකු හෝ සමාන තනතුරු හොබවන වෘත්තිකයින් දෙදෙනෙකු. මෙම දෙදෙනාගෙන් එක් අයෙකු, ආයතනය අනුබද්ධිතව ඇති විශ්වවිද්‍යාලයෙන් බාහිර තැනැත්තෙකු විය යුතු ය.

කරුණු එසේ වුව ද;

ආයතනයේ අධ්‍යක්ෂවරයා, එම ආයතනයේම ස්ථිර කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු සහ තනතුරට අයදුම් කොට ඇත්තේ, එම අධ්‍යක්ෂවරයාම නම්, ඔහු ආයතනයේ උක්ත කරුණට අදාල සියළුම බලධරයන්ගේ රැස්වීම් වලින් ඉවත් විය යුතු අතර, එකී බලධරයින් විසින් තාවකාලිකව පත් කර ගත් සභාපතිවරයකු යටතේ අදාල කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය තීරණ ගත යුතු වේ.

සටහන:

ඉහත තනතුරේ ස්ථිර කිරීම සඳහා අවශ්‍ය තේරීම් කමිටුව, මෙහි 4.1 උපඡේදයේ (i), (ii), (iii) සහ (iv) වගන්තිවල සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු වේ. එහෙත්, මෙම නියමය කුසලතා පදනම මත උසස් වීම් ලද තැනැත්තන් කෙරෙහි බලපවත්වන්නේ නැත.

## 5. සහාය මහාචාර්ය/මහාචාර්ය තනතුර සඳහා වූ තේරීම් කමිටුවක සංයුතිය

### 5.1 විශ්වවිද්‍යාලයක්/ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක්

පනතෙහි X වන කොටසෙහි දක්වා ඇති ප්‍රතිපාදනයන්ට යටත්ව, විශ්වවිද්‍යාලයක/ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක සෑම සහාය මහාචාර්ය/ මහාචාර්ය තනතුරකම, පත්කිරීමක් සහ කුසලතා පදනම මත උසස් කිරීමක්ම, පහත සඳහන් සංයුතියකින් යුතු තේරීම් කමිටුවක නිර්දේශය මත එම විශ්වවිද්‍යාලයේ/ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයේ පාලක බල මණ්ඩලය විසින් සිදු කළ යුතු ය.

(i) ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා, තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්

(ii) කොමිෂන් සභාව විසින් පත් කරන ලද තැනැත්තන් දෙදෙනෙකු

(iii) කොමිෂන් සභාව විසින් පාලක බල මණ්ඩලයට පත් කරන ලද සාමාජිකයින් අතුරින් තෝරා ගත් පාලක බල මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙක්

(iv) අදාල පීඨයේ පීඨාධිපතිවරයා
(v) අදාල අධ්‍යයනාංශයේ අංශාධිපතිවරයා
(vi) අවම වශයෙන් ප්‍රථම උපාධි මට්ටමේ දී හෝ අදාල විෂය සම්බන්ධයෙන් දැනුමක් සහිත, සනාථන සභාව විසින් තම සාමාජිකයින් අතුරින් පත්කල ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් දෙදෙනෙකු

තනතුරට සලකා බැලෙන්නේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක වූ කල්හි, ඉහතින් සඳහන් එක් සාමාජිකයකු, එම විශ්වවිද්‍යාල විද්‍යායතනය අනුබද්ධිතව පවත්නා විශ්වවිද්‍යාලයේ සනාථන සභාව විසින් නම් කළ යුතු අතර, අනෙක් සාමාජිකයා එම විද්‍යායතනයේ ශාස්ත්‍රීය කමිටුව විසින් නම් කළ යුතු ය.

කරුණු එසේ වුව ද;

(අ) තනතුර සඳහා අයදුම්කොට ඇත්තේ, අංශාධිපතිවරයා නම් හෝ එම අධ්‍යයනාංශයේ මේ වන විට ස්ථිර අංශාධිපතිවරයකු නොමැති නම් හෝ අවස්ථාවෝචිත පරිදි සනාථන සභාව / ශාස්ත්‍රීය කමිටුව විසින්, අදාල විෂය සම්බන්ධයෙන් දැනුමක් සහිත, තම සාමාජිකයින් අතුරින් තෝරා ගත් සාමාජිකයකු එකී අංශාධිපතිවරයා වෙනුවට තේරීම් කමිටුවට පත්කල යුතු වේ.

(ආ) තනතුර සඳහා අයදුම්කොට ඇත්තේ, අදාල පීඨයේ පීඨාධිපතිවරයා නම්, අවස්ථාවෝචිත පරිදි සනාථන සභාව / ශාස්ත්‍රීය කමිටුව විසින් එම පීඨාධිපතිවරයා වෙනුවට වෙනත් සුදුසු තැනැත්තෙකු තේරීම් කමිටුවට පත්කල යුතු ය.

(ඇ) තනතුර සඳහා අයදුම්කොට ඇත්තේ, විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා හෝ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා නම්, අදාල කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා වන සෑම සනාථන සභා/ ශාස්ත්‍රීය කමිටු රැස්වීමකින්ම එකී උපකුලපතිවරයා/ අධ්‍යක්ෂවරයා ඉවත්විය යුතු අතර, එවැනි කරුණු පාලක බල මණ්ඩලය විසින් තාවකාලික (pro-tem) සභාපතිවරයකු පත් කොට එම තාවකාලික සභාපතිවරයා යටතේ සාකච්ඡා කරනු ඇත. අදාල තේරීම් කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කිරීම සඳහා වෙනත් බාහිර ආයතනයක තැනැත්තෙකු කොමිෂන් සභාව විසින් පත් කරනු ඇත.

සටහන:

1. මෙහි 5.1 උපඡේදයෙහි සඳහන් නියමයන්, *අවශ්‍ය වෙනස්කම් කිරීමට යටත්ව* ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහාය මහාචාර්ය/ මහාචාර්ය තනතුරකට පත්කිරීමට/උසස් කිරීමට ද අදාල වේ.

2. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ද ඇතුළුව ඉහත සඳහන් තනතුරක, තනතුරේ ස්ථිර කිරීම සඳහා වන තේරීම් කමිටුව, මෙහි 5.1 උපඡේදයෙහි (i), (iii), (iv) සහ (v) සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු වේ. මෙම නියමය කුසලතා පදනම මත තනතුරට උසස් වූ තැනැත්තන් කෙරෙහි බල පවත්වන්නේ නැත.

5.2 ආයතනයන්

පනතෙහි X වන කොටසෙහි දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අනුව, ආයතනයක සෑම සහාය මහාචාර්ය/ මහාචාර්ය තනතුරක් සඳහා වන පත්කිරීමක් හෝ කුසලතාවය මත උසස් කිරීමක් ම, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත තේරීම් කමිටුවක නිර්දේශය මත, එම ආයතනය අනුබද්ධිතව පවත්නා විශ්වවිද්‍යාලයේ පාලක බල මණ්ඩලය විසින් සිදු කළ යුතු වේ.

(i) ආයතනය අනුබද්ධිතව පවතින විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා, තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්.
(ii) ආයතනයේ අධ්‍යක්ෂවරයා. ආයතනයේ අධ්‍යක්ෂවරයා තනතුර සඳහා අයදුම්කරුවකු ලෙස ඉදිරිපත්වන අවස්ථාවක දී, එම ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් අතුරින් එක් සාමාජිකයකු එම අධ්‍යක්ෂවරයා වෙනුවට කොමිෂන් සභාව විසින් පත්කල යුතු ය.
(iii) කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන තැනැත්තන් දෙදෙනෙකු
(iv) පාලක බල මණ්ඩලයට කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබූ සාමාජිකයින් අතුරින් තෝරා ගත් සාමාජිකයින් දෙදෙනෙකු
(v) ආයතනය අනුබද්ධිතව පවත්නා විශ්වවිද්‍යාලයේ සනාථන සභාව විසින් පත් කරනු ලබන, විශ්වවිද්‍යාලයේ අදාල පීඨයක පීඨාධිපතිවරයකු
(vi) සනාථන සභාව විසින් තම සාමාජිකයින් අතුරින් පත් කරනු ලබන, විෂය සම්බන්ධ දැනුමක් සහිත සාමාජිකයින් දෙදෙනෙකු

කරුණු එසේ වුව ද;

ආයතනයේ අධ්‍යක්ෂවරයා එම ආයතනයේ ම ස්ථිර කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වන විට සහ තමා තනතුරේ අයදුම්කරුවකු වූ විට, එම අධ්‍යක්ෂවරයා ආයතනයේ උක්ත කරුණට අදාල සියළුම බලධාරීන්ගේ රැස්වීම් වලින් ඉවත්විය යුතු අතර, එම රැස්වීම් සඳහා තාවකාලිකව පත්කර ගත් සභාපතිවරයකු (pro-tem) යටතේ, කරුණු සාකච්ඡා කොට තීරණය කළ යුතු ය.

සටහන:

ඉහත සඳහන් තනතුරේ ස්ථිර කිරීම සඳහා අවශ්‍ය තේරීම් කමිටුව, මෙහි ඉහත 5.2 උපඡේදයෙහි (i), (ii), (iv) සහ (v) වගන්තිවල සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු වේ. මෙම නියමය කුසලතා පදනම මත තනතුරට උසස් කරන ලද තැනැත්තන් කෙරෙහි බලපවත්වන්නේ නැත.

## 6. පුස්තකාලයාධිපති තනතුර සඳහා නියමිත තේරීම් කමිටුවක සංයුතිය

6.1 විශ්වවිද්‍යාලයක්/විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක්

පනතෙහි X වන කොටසෙහි දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අනුව විශ්වවිද්‍යාලයක්/

විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක පුස්තකාලයාධිපති තනතුර සඳහා වූ සෑම පත්කිරීමක්ම, පහත දැක්වෙන සංයුතියකින් යුත් තේරීම් කමිටුවක නිර්දේශය මත, විශ්වවිද්‍යාලයක/ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක පාලක බල මණ්ඩලය විසින් සිදු කළ යුතු වේ.

(i) ප්‍රධාන විධායක නිලධරයා, තේරීම් කමිටුවේ සභාපතිවරයා ලෙස
(ii) කොමිෂන් සභාව විසින් පත් කරන ලද සමාජිකයින් දෙදෙනෙකු
(iii) අදාල පාලක බල මණ්ඩලයට කොමිෂන් සභාව විසින් පත් කරන ලද පාලක බල මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු
(iv) සනාථන සභාව විසින් නම් කරන ලද පීඨයක පීඨාධිපතිවරයකු
(v) සනාථන සභාව විසින් නම් කරන ලද වෙනත් විශ්වවිද්‍යාලයක පුස්තකාලයාධිපතිවරයකු
(vi) අවස්ථාවෝචිත පරිදි සනාථන සභාව/ ශාස්ත්‍රීය කමිටුව විසින් තම සාමාජිකයින් අතුරින් පත් කරන ලද, අදාල විෂය පිළිබඳ දැනුමක් සහිත ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/ මහාචාර්ය තනතුරු දරන්නන් දෙදෙනෙකු.

සටහන:

1. මෙහි 6.1 උපඡේදයෙහි සඳහන් නියමයන්, *අවශ්‍ය වෙනස්කම් කිරීමට යටත්ව* ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති තනතුරකට පත්කිරීම්/ උසස් කිරීම සඳහා ද අදාල වේ.

2. විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක් විෂයයෙහි, අදාල තේරීම් කමිටුව සඳහා එම විශ්වවිද්‍යාලීය විද්‍යායතනය අනුබද්ධිතව පවතින, විශ්වවිද්‍යාලයේ සනාථන සභාවේ සාමාජිකයින් අතුරින් එක් සාමාජිකයකු ද, විද්‍යායතනයේ ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයින් අතුරින් එක් සමාජිකයකු ද නම් කළ යුතු ය.

3. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ද ඇතුළුව පුස්තකාලයාධිපති තනතුරේ ස්ථිර කිරීම සඳහා වන තේරීම් කමිටුව මෙහි 6.1 උපඡේදයෙහි (i), (iii) සහ (vi) සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු වේ.

6.2 ආයතනයන්

පනතෙහි X වන කොටසෙහි දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අනුව, ආයතනයක පුස්තකාලයාධිපති තනතුරක් සඳහා වන සෑම පත්කිරීමක් ම, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත තේරීම් කමිටුවක නිර්දේශය මත එකී ආයතනය අනුබද්ධිතව පවත්නා විශ්වවිද්‍යාලයේ පලක සභාව විසින් සිදු කළ යුතු ය.

(i) ආයතනය අනුබද්ධිතව පවත්නා විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා; තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්,
(ii) ආයතනයේ අධ්‍යක්ෂවරයා,
(iii) කොමිෂන් සභාව විසින් පත්කල තැනැත්තන් දෙදෙනෙකු,

(iv) කොමිෂන් සභාව මගින් අදාල පාලක බල මණ්ඩලයට පත්කල සාමාජිකයින් අතුරින් තෝරාගත්, පාලක බල මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙක්

(v) ආයතනය අනුබද්ධිතව පවත්නා විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිවරයා. විශ්වවිද්‍යාලයේ ස්ථිර පුස්තකාලයාධිපතිවරයකු නොමැති අවස්ථාවකදී, විශ්වවිද්‍යාලයේ සනාථන සභාව විසින් වෙනත් විශ්වවිද්‍යාලයක පුස්තකාලයාධිපතිවරයකු නම් කළ යුතු ය.

(vi) සනාථන සභාව විසින් තම සාමාජිකයින් අතුරින් පත්කල අදාල විෂය සම්බන්ධ දැනුමක් සහිත සාමාජිකයින් දෙදෙනෙකු

සටහන:

ඉහත තනතුරේ ස්ථිර කිරීම, මෙහි 6.2 උපඡේදයෙහි (ii), (iv) සහ (vi) හි සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත තේරීම් කමිටුවක් මගින් සිදු කළ යුතු වේ.

## 7. නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුර සඳහා වූ තේරීම් කමිටුවක සංයුතිය

7.1 විශ්වවිද්‍යාලයක් /විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක්

පනතෙහි X වන කොටසෙහි දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අනුව, විශ්වවිද්‍යාලයක/ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුරක කුසලතා පදනම මත සිදු කරන්නා වූ සෑම උසස් කිරීමක් ම, පහත දැක්වෙන සංයුතියකින් යුතු තේරීම් කමිටුවක නිර්දේශය මත එම උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලය විසින් සිදු කළ යුතු ය;

(i) ප්‍රධාන විධායක නිලධරයා, තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්

(ii) සනාථන සභාව විසින් නම් කරන ලද පීඨයක පීඨාධිපතිවරයකු. විද්‍යායතනයක් නම්, එහි ශාස්ත්‍රීය කමිටුව මගින් මෙම නම් කිරීම සිදු කළ යුතු ය.

(iii) අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයේ/ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ පුස්තකාලයාධිපතිවරයා

(iv) අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයේ සනාථන සභාව මගින්/ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය මගින් නම් කළ වෙනත් පුස්තකාලයාධිපතිවරුන් දෙදෙනෙකු

(v) කොමිෂන් සභාව විසින් අදාල පාලක බල මණ්ඩලයට පත් කරන ලද සාමාජිකයින් අතුරින් තෝරා ගත්, පාලක බල මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු

(vi) කොමිෂන් සභාව විසින් නම් කරන ලද මහාචාර්ය වරුන් දෙදෙනෙකු

සටහන:

1. ඉහත උපඡේදයෙහි සඳහන් නියමයන් අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට යටත්ව, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුරකට උසස් කිරීම සඳහා ද අදාල වේ.

7.2 ආයතනයන්

පනතෙහි X වන කොටසෙහි දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අනුව, ආයතනයක නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුරක් සඳහා කුසලතා පදනම මත සිදු කරන්නා වූ සෑම උසස් කිරීමක් ම පහත සඳහන් තැතැත්තන්ගෙන් සමන්විත තේරීම් කමිටුවක නිර්දේශය මත, එම ආයතනය අනුබද්ධිතව පවත්නා විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සිදු කළ යුතු ය.

(i) ආයතනය අනුබද්ධිතව පවත්නා විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා; තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්

(ii) ආයතනයේ අධ්‍යක්ෂවරයා

(iii) ආයතනය අනුබද්ධිතව පවත්නා විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිවරයා

(iv) ආයතනය අනුබද්ධිතව පවත්නා විශ්වවිද්‍යාලයේ සනාථන සභාව විසින් නම් කළ වෙනත් පුස්තකාලයාධිපතිවරුන් දෙදෙනෙකු

(v) කොමිෂන් සභාව විසින්, අදාල පාලක බල මණ්ඩලයට පත් කරන ලද සාමාජිකයින් අතුරින් තෝරා ගත්, පාලක බල මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු

(vi) කොමිෂන් සභාව විසින් නම් කරන ලද මහාචාර්යවරුන් දෙදෙනෙකු

## 8. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/මහාචාර්ය/ සහාය මහාචාර්ය හෝ පුස්තකාලයාධිපති/නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුරක් හැරෙන්නට, ආචාර්යවරයකු සඳහා වන තේරීම් කමිටුවක සංයුතිය

8.1 විශ්වවිද්‍යාලයක් /විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක්

පනතෙහි X වන කොටසෙහි සඳහන් ප්‍රතිපාදනයන්ට අනුව, උසස් අධ්‍යාපන ආයතනයක ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/ මහාචාර්ය/ සහාය මහාචාර්ය හෝ පුස්තකාලයාධිපති/ නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුරු හැරෙන්නට ආචාර්ය තනතුරක් සඳහා වන සෑම පත් කිරීමක්/ උසස් කිරීමක්ම පහත සඳහන් තේරීම් කමිටුවේ නිර්දේශයන්ට අනුව, එම උසස් අධ්‍යාපන ආයතනයෙහි පාලක බල මණ්ඩලය විසින් සිදු කළ යුතු වේ.

(i) ප්‍රධාන විධායක නිලධරයා, තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්

(ii) අදාල වන පීඨයක පීඨාධිපතිවරයා

(iii) අදාල අධ්‍යයනාංශයේ අංශාධිපතිවරයා.
කරුණු එසේ වුවද, අදාල අධ්‍යයනාංශයේ අංශාධිපතිවරයා එම තනතුරේ අයදුම්කරුවකු වූ විට හෝ එකී අධ්‍යයනාංශයේ ස්ථිර අංශාධිපතිවරයකු නොමැති වූ විට, අවස්ථාවෝචිත පරිදි සනාථන සභාව විසින් හෝ ශාස්ත්‍රීය කමිටුව විසින් හෝ අදාල විෂය සම්බන්ධයෙන් දැනුමක් සහිත තැනැත්තෙකු එම අංශාධිපතිවරයා වෙනුවට තම සාමාජිකයින් අතුරින් පත්කර ගත යුතු ය.

(iv) කොමිෂන් සභාව මඟින් පාලක බල මණ්ඩලයට පත්කල සාමාජිකයින් අතුරින් තෝරා ගත්, පාලක බල මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙක්

(v) තම සාමාජිකයින් අතුරින් පත්කර ගන්නා ලද, අදාල විෂය සම්බන්ධ දැනුම සහිත සනාථන සභාවේ හෝ ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයින් දෙදෙනෙකු

තනතුර පවතින්නේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක නම්, ඉහත සඳහන් තැනැත්තන්ගෙන් එක් තැනැත්තෙකු, එම විද්‍යායතනය අනුබද්ධිතව පවතින විද්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් එම විශ්වවිද්‍යාලයේ උචිත පීඨයක සාමාජිකයින් අතුරින් පත් කරනු ඇත.

සටහන:

1. ඉහත උපඡේදයෙහි සඳහන් නියමයන් *අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට යටත්ව* ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/ මහාචාර්ය/ සහාය මහාචාර්ය/ පුස්තකාලයාධිපති/ නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුරු හැරෙන්නට, ආචාර්ය තනතුරක පත්කිරීම්/ උසස් කිරීම් සඳහා අදාල වේ.

2. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ද ඇතුළුව සෑම උසස් අධ්‍යාපන ආයතනයකම ආචාර්යවරයකු තනතුරේ ස්ථිර කිරීම සඳහා වන තේරීම් කමිටුවේ සංයුතිය, ඉහත 8.1 උපඡේදයෙහි (i), (ii), (iii) සහ (iv) හි සඳහන් පරිදි වේ. සාමාන්‍ය උසස් කිරීම් සඳහා මෙම නියමය බලපවත්වන්නේ නැත.

3. තනතුරෙහි ස්ථිර කිරීම සහ උසස් කිරීම යන කරුණු දෙකම එකම අවස්ථාවක දී සලකා බලන විට, මෙහි ඉහත 8.1 උපඡේදයෙහි සඳහන් තේරීම් කමිටුව අදාල කර ගත යුතු ය.

8.2 ආයතනයන්

පනතෙහි X වන කොටසෙහි සඳහන් ප්‍රතිපාදනයන්ට අනුව, යම් ආයතනයක ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/ මහාචාර්ය/ සහාය මහාචාර්ය හෝ පුස්තකාලයාධිපති/ නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුරු හැරෙන්නට ආචාර්යවරයකු වශයෙන් පවත්නා තනතුරකට පත්කිරීම්/ උසස් කිරීම, පහත සඳහන් තේරීම් කමිටුවේ නිර්දේශයට අනුව, එම ආයතනය අනුබද්ධිතව පවත්නා විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සිදු කළ යුතු ය.

(i) ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා; තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්

(ii) කොමිෂන් සභාව විසින් තේරීම් කමිටුවට පත්කරන ලද, ශ්‍රී ලංකාවේ ඕනෑම විශ්වවිද්‍යාලයක උචිත පීඨයක පීඨාධිපතිවරයකු

(iii) අදාල අධ්‍යයනාංශයේ අංශාධිපතිවරයා (අධ්‍යයනාංශයක් තිබෙන්නා වූ ආයතනයන් විෂයයෙහි පමණි.)

එම අධ්‍යයනාංශයේම අංශාධිපතිවරයා තනතුර සඳහා අයදුම් කොට ඇති විට හෝ එම අධ්‍යයනාංශයේ ස්ථිර අංශාධිපතිවරයකු නොමැති විට හෝ ආයතනයේ අධ්‍යයනාංශයක් නොමැති විට හෝ, අධ්‍යයන මණ්ඩලය (Board of Study) හෝ වෙනත් එවැනි බලධරයකු විසින් අවස්ථාවෝචිත පරිදි අදාල විෂය පිළිබඳ දැනුමක් ඇති තම සාමාජිකයකු තේරීම් කමිටුවට පත්කල යුතු ය.

(iv) ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් තම සාමජිකයින් අතුරින් නම් කරනු ලබන සාමාජිකයින් සිව්දෙනෙකු. මෙම තැනැත්තන් අතුරින් දෙදෙනෙකු කොමිෂන් සභාව විසින් කළමනාකරණ මණ්ඩලයට පත්කල තැනැත්තන් විය යුතු ය.

සටහන:

1. ඉහත පරිදි තනතුරේ ස්ථිර කිරීම සඳහා වන තේරීම් කමිටුවට, මෙහි 8.2 උපඡේදයෙහි සඳහන් (i), (ii), (iii) සහ කළමනාකරණ මණ්ඩලය විසින් නම් කළ තැනැත්තන් දෙදෙනෙකු ද ඇතුලත් විය යුතු ය. කළමනාකරණ මණ්ඩලයෙන් නම් කරන තැනැත්තන් දෙදෙනා, කොමිෂන් සභාව විසින් එම මණ්ඩලයට පත්කල සාමාජිකයින් අතුරින් තෝරා ගත යුතු වේ. සාමාන්‍ය උසස් වීම් සඳහා මෙම නියමයන් බලපවත්වන්නේ නැත.

2. තනතුරේ ස්ථිර කිරීම සහ උසස් කිරීම යන කරුණු දෙකම, එකම අවස්ථාවක දී සලකා බලන විට, ඉහත 8.2 උපඡේදයෙහි සඳහන් තේරීම් කමිටුවම අදාල කර ගත යුතු ය.

9. **සහකාර පුස්තකාලයාධිපති/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති I සහ II ශ්‍රේණි තනතුරු සඳහා වන තේරීම් කමිටුවක සංයුතිය**

9.1 විශ්වවිද්‍යාලයක් /විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක්

පනතෙහි X වන කොටසෙහි සඳහන් ප්‍රතිපාදනයන්ට අනුව, විශ්වවිද්‍යාලයක/ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක සෑම සහකාර පුස්තකාලයාධිපති/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති I සහ II ශ්‍රේණි තනතුරකට පත්කිරීම්/ උසස් කිරීම් පහත සඳහන් සංයුතියකින් යුතු තේරීම් කමිටුවක නිර්දේශයන්ට අනුව, එම විශ්වවිද්‍යාලයේ/විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පාලක බල මණ්ඩලය විසින් සිදු කළ යුතු ය.

(i) ප්‍රධාන විධායක නිලධරයා; තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්

(ii) සනාතන සභාව/ ශාස්ත්‍රීය කමිටුව විසින් නම් කරන ලද පීඨයක පීඨාධිපතිවරයකු

(iii) විශ්වවිද්‍යාලයේ/ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයේ පුස්තකාලයාධිපතිවරයා

ස්ථිර පුස්තකාලයාධිපතිවරයකු නොමැති අවස්ථාවකදී, අවස්ථාවෝචිත පරිදි සනාථන සභාව/ ශාස්ත්‍රීය කමිටුව විසින් වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක පුස්තකාලයාධිපතිවරයකු තේරීම් කමිටුවට නම් කළ යුතු ය.

(iv) අදාල පාලක බල මණ්ඩලයට කොමිෂන් සභාව විසින් පත්කරන ලද තැනැත්තන් අතුරින් තොරා ගත් පාලක බල මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙක්

(v) සනාථන සභාව හෝ ශාස්ත්‍රීය කමිටුව විසින් තම සාමාජිකයින් අතුරින් තෝරා ගත් සාමාජිකයින් දෙදෙනෙකු

තනතුර පවතින්නේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක නම්, එවැනි එක් සාමාජිකයකු විද්‍යායතනය අනුබද්ධිතව පවතින විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් පත්කල යුතු ය.

සටහන:

1. ඉහත උපඡේදයෙහි සඳහන් නියමයන්, *අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට යටත්ව* ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහකාර පුස්තකාලයාධිපති/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති I සහ II ශ්‍රේණි තනතුරු වල පත්කිරීම්/ උසස් කිරීම් සඳහා ද අදාල වේ.

2. ඉහතින් දක්වා ඇති තනතුරුවල, තනතුරේ ස්ථිර කිරීම සඳහා ඉහත 9.1 උපඡේදයෙහි (i), (ii), (iii) සහ (iv) හි සඳහන් තේරීම් කමිටුවම යොදා ගත හැකි ය. මෙම නියමය තනතුරේ සාමාන්‍ය උසස් වීමක් සඳහා බල පවත්වන්නේ නැත.

3. තනතුරේ ස්ථිර කිරීම සහ උසස් කිරීම යන කරුණු දෙකම එකම අවස්ථාවක දී සිදු කරන විට ඒ සඳහා ඉහත 9.1 උපඡේදයෙහි සඳහන් තේරීම් කමිටුවම අදාල කර ගත හැකි ය.

9.2 ආයතනයන්

පනතෙහි X වන කොටසෙහි දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අනුව යම් ආයතනයක සෑම සහකාර පුස්තකාලයාධිපති/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති I සහ II ශ්‍රේණි තනතුරකම පත්කිරීම්/ උසස් කිරීම් පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත තේරීම් කමිටුවක නිර්දේශය මත, එම ආයතනය අනුබද්ධිතව පවතින විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සිදු කළ යුතු ය.

(i) ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා; තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්

(ii) උචිත ආකාරයෙන්, කොමිෂන් සභාව විසින් පත් කරන ලද , ශ්‍රී ලංකාවේ ඕනෑම විශ්වවිද්‍යාලයක පීඨාධිපතිවරයකු

(iii) ආයතනය අනුබද්ධිතව පවතින විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිවරයා. ස්ථිර පුස්තකාලයාධිපතිවරයකු නොමැති අවස්ථාවකදී සනාථන සභාව විසින් වෙනත් විශ්වවිද්‍යාලයක පුස්තකාලයාධිපතිවරයකු නම් කරනු ඇත.

(iv) කළනමාකරණ මණ්ඩලය විසින් නම් කරනු ලබන, කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් සිව් දෙනෙකු. මෙම සාමාජිකයින් අතුරින් දෙදෙනෙකු කොමිෂන් සභාව් විසින් කළමනාකරණ මණ්ඩලයට පත් කරන ලද තැනැත්තන් විය යුතු ය.

සටහන:

1. ඉහත තන්තුරේ ස්ථිර කිරීම සඳහා වන තේරීම් කමිටුවට, මෙහි 9.2 උපඡේදයේ (i), (ii), (iii) හි සඳහන් සාමාජිකයින් ඇතුලත් විය යුතු ය. එයට අමතරව කළමනාකරණ මණ්ඩලයට කොමිෂන් සභාව මඟින් පත් කොට ඇති සාමාජිකයින් දෙදෙනෙකු ද එම තේරීම් කමිටුවට ඇතුලත් විය යුතු වේ. මෙහි සඳහන් නියමයන්, සාමාන්‍ය උසස් වීම් සඳහා බල පවත්වන්නේ නැත.

2. තනතුරේ ස්ථිර කිරීම සහ උසස් කිරීම එකම අවස්ථාවක දී සලකා බලන විට, මෙහි 9.2 උපඡේදයෙහි සඳහන් තේරීම් කමිටුවම අදාල කර ගත යුතු ය.

10. (1) **කොමිෂන් සභාවේ ලේකම් තනතුර**

පනතෙහි 8 (1) (a) වගන්තියෙහි දක්වා ඇති පරිදි, කොමිෂන් සභාවේ, ලේකම්වරයා වශයෙන් සිදු කරන්නා වූ සෑම පත්වීමක්ම, පහත සඳහන් සංයුතියකින් සමන්විත තේරීම් කමිටුවක නිර්දේශය මත, කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු ය.

(i) කොමිෂන් සභාවේ සභාපතිවරයා; තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්
(ii) කොමිෂන් සභාව විසින් තම සාමාජිකයින් අතුරින් පත්කරනු ලැබූ සාමාජිකයින් දෙදෙනෙකු
(iii) කොමිෂන් සභාව විසින් යෝජනා කරනු ලබන අමාත්‍යංශ ලේකම්වරයකු හා සමාන තනතුරු හොබවන, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් දෙදෙනෙකු

සටහන :

1. මෙම තනතුරේ ස්ථිර කිරීම සඳහා වන තේරීම් කමිටුව, ඉහත 10 (1) උපඡේදයේ (i) සහ (ii) තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය..

(2) **කොමිෂන් සභාවේ අනෙකුත් නිලධාරීන්**

අතිරේක ලේකම්, ප්‍රධාන ගණකාධිකාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක, අතිරේක ලේකම් (නීති සහ ප්‍රලේඛන), නියෝජ්‍ය ලේකම් (නීති සහ ප්‍රලේඛන), ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (නීති සහ ප්‍රලේඛන), සහකාර ලේකම් (නීති සහ ප්‍රලේඛන ) සහ පනතෙහි 8 (1) (b) වගන්තියට අනුව, කොමිෂන් සභාවේ විධායක නිලයේ අනෙකුත් සෑම තනතුරකම පත්කිරීම්, පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත තේරීම් කමිටුවක නිර්දේශය මත, කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු ය;

(i) කොමිෂන් සභාවේ සභාපතිවරයා; තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්
(ii) කොමිෂන් සභාවේ සාමාජිකයින් අතුරින් පත්කර ගත් එහි එක් සාමාජිකයකු
(iii) කොමිෂන් සභාවේ ලේකම්වරයා
(iv) කොමිෂන් සභාව විසින් පත්කල, එහි සාමාජිකයින් නොවන තැනැත්තන් දෙදෙනෙකු. මෙම දෙදෙනාගෙන් එක් තැනැත්තෙකු අදාල විෂය ක්ෂේත්‍රය තුලින් විය යුතු ය.

සටහන:

මෙහි ඉහත 10 (2) උපඡේදයෙහි (i), (ii) සහ (iii) හි සඳහන් තැනැත්තන් ඉහත තනතුරක, තනතුරේ ස්ථිර කිරීම සඳහා වන තේරීම් කමිටුවේ සංයුතිය විය යුතු වේ.

(3) **කොමිෂන් සභාවේ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය**

පනතෙහි 8 (1) (b) වගන්තියට අනුව, කොමිෂන් සභාවේ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයට අයත් තනතුරක සෑම පත්කිරීමක්/ උසස් කිරීමක් ම පහත සඳහන් තේරීම් කමිටුවේ නිර්දේශය මත, කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු ය;

(i) කොමිෂන් සභාවේ සභාපතිවරයා; තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්
(ii) කොමිෂන් සභාවේ සාමාජිකයින් අතුරින් පත්කර ගත් එහි එක් සාමාජිකයකු
(iii) කොමිෂන් සභාවේ ලේකම්වරයා
(iv) කොමිෂන් සභාව විසින් කරන ලද, කොමිෂන් සභා සාමාජිකයින් නොවන තැනැත්තන් දෙදෙනෙකු. මෙම දෙදෙනාගෙන් එක් සාමාජිකයකු අදාල විෂය ක්ෂේත්‍රයෙහි ප්‍රවීනයකු විය යුතු ය.

සටහන:

ඉහත සඳහන් තනතුරේ ස්ථිර කිරීම සඳහා වන තේරීම් කමිටුව, මෙහි ඉහත 10 (3) උපඡේදයෙහි (i), (ii) සහ (iii) හි සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත යුතු වේ.

(4) **කොමිෂන් සභාවේ අනෙකුත් සේවකයින්**

පනතෙහි 8 (1) (b) වගන්තියට අනුව, කොමිෂන් සභාවේ අනෙකුත් සෑම තනතුරකම පත්කිරීමක්/ උසස් කිරීමක් ම පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත තේරීම් කමිටුවේ නිර්දේශය මත, කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු ය;

(i) කොමිෂන් සභාවේ ලේකම්වරයා
(ii) කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් පත්කරනු ලබන, එම සභාවේ විධායක මට්ටමේ තනතුරු දරන නිලධාරීන් අතුරින් තෝරා ගත් දෙදෙනෙකු

සටහන:

ඉහත දක්වා ඇති තනතුරක, තනතුරේ ස්ථිර කිරීම සඳහා මෙහි ඉහත 10 (4) උපඡේදයෙහි (i) සහ (ii) හි සඳහන් තැනැත්තෙකුගෙන් සමන්විත තේරීම් කමිටුවක් මඟින් සිදු කළ යුතු වේ.

(5) **ප්‍රාථමික ශ්‍රේණි සේවකයින්, කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුරු සඳහා පත්කිරීම ( සීමිත කාණ්ඩ පදනම මත)**

පනතෙහි X වන කොටසෙහි අඩංගු ප්‍රතිපාදනයන්ට අනුව , ප්‍රාථමික ශ්‍රේණි සේවකයින්, කළමනාකරණ සහකාර III වන ශ්‍රේණියේ තනතුරු සඳහා පත්කිරීම, පහත දැක්වෙන සංයුතියකින් යුතු තේරීම් කමිටුවක නිර් දේශය මත කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු ය;

(i) කොමිෂන් සභාව විසින්, තම සාමාජිකයින් අතුරින් පත්කර ගත් සාමාජිකයකු, තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්
(ii) කොමිෂන් සභාවේ ලේකම්වරයා
(iii) කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් පත්කරන ලද, එම සභාවේ පරිපාලන කාර්ය මණ්ඩලයේ නිලධාරියකු

සටහන:

1. මෙම පත්කිරීම්වලට අදාල පත්වීමේ ලිපි කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද, කුසලතා ලැයිස්තුව පදනම් කොට ගෙන, ඒ ඒ උසස් අධ්‍යාපන ආයතන මඟින් නිකුත් කළ යුතු ය.

2. මෙම තනතුරුවල, තනතුරේ ස්ථිර කිරීම අදාල වන පරිදි මෙහි 10 (4) උපඡේදය සහ 17 ඡේදයට අනුව පත්කල තේරීම් කමිටුවක් විසින් සිදු කළ යුතු ය.

11. **විශ්වවිද්‍යාලයක පළමුවන ලේඛකාධිකාරීවරයා / මූල්‍යාධිකාරීවරයා**

(1) පනතෙහි 144 (b) සහ 144 (c) උපවගන්තිවල දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අනුව, විශ්වවිද්‍යාලයක පළමුවන ලේඛකාධිකාරීවරයා සහ මූල්‍යාධිකාරීවරයා ලෙස සිදු කරන සෑම පත්කිරීමක්ම පහත දැක්වෙන සංයුතියකින් යුතු තේරීම් කමිටුවක නිර්දේශය මත, කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු ය;

(i) කොමිෂන් සභාවේ සභාපතිවරයා, තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්
(ii) තම සාමාජිකයින් අතුරින් පත්කරගත්, කොමිෂන් සභාවේ සාමාජිකයකු
(iii) කොමිෂන් සභාවේ ලේකම්වරයා
(iv) කොමිෂන් සභාව විසින් පත්කරන ලද, කොමිෂන් සභාවේ නොවන තැනැත්තන් දෙදෙනෙකු.

පත්කිරීම මූල්‍යාධිකාරී තනතුරකටවන අවස්ථාවක දී, ඉහතින් සඳහන් තැනැත්තන් දෙදෙනාගෙන් එක් තැනැත්තෙකු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CASL)/ කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ (CIMA) / සහතිකලත් සහ සංස්ථාපිත ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) සාමාජිකයකු විය යුතු ය.

සටහන:

1. පළමුවරට පත්කරන ලද ලේඛකාධිකාරීවරයකු සිය තනතුරේ ස්ථිර කිරීම සඳහා වන තේරීම් කමිටුව, මෙහි පහත සඳහන් 14 වන වගන්තියෙහි දක්වා ඇති සංයුතියට අනුව විය යුතු ය.

2. පළමුවරට පත්කරන ලද මූල්‍යාධිකාරීවරයකු සිය තනතුරේ ස්ථිර කිරීම සඳහා වන තේරීම් කමිටුව, මෙහි පහත සඳහන් 15 වන වගන්තියෙහි දක්වා ඇති සංයුතියට අනුව විය යුතු ය.

12. පනතෙහි X වන කොටසෙහි අඩංගු ප්‍රතිපාදනයන්ට අනුව සහ පනතෙහි 71 (2) (i) වගන්තිය ප්‍රකාරව නිලධරයකු වශයෙන් පහතින් දක්වා ඇති තනතුරකට වන සෑම පත්කිරීමක් ම, මෙහි (ආ) යටතේ දක්වා ඇති තේරීම් කමිටුවක නිර්දේශය මත, කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු ය;

(අ) තනතුරු:

නියෝජ්‍ය ලේකම්/ නියෝජ්‍ය ලේඛකාධිකාරී,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
සහකාර ලේකම්/ සහකාර ලේඛකාධිකාරී,
නියෝජ්‍ය ගණකාධිකාරී/ නියෝජ්‍ය මූල්‍යාධිකාරී/ නියෝජ්‍ය භාණ්ඩාගාරික/ නියෝජ්‍ය අභ්‍යන්තර විගණක,
ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
ජ්‍යෙෂ්ඨ සහකාර භාණ්ඩාගාරික/ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක,
සහකාර ගණකාධිකාරී/ සහකාර මූල්‍යාධිකාරී/ සහකාර භාණ්ඩාගාරික/ සහකාර අභ්‍යන්තර විගණක,
සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවා),

(ආ) තේරීම් කමිටුව:

(i) කොමිෂන් සභාවේ සභාපතිවරයා, තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්;
(ii) කොමිෂන් සභාවේ ලේකම්වරයා;
(iii) කොමිෂන් සභාව විසින් තේරීම් කමිටුවට පත්කරන ලද උපකුලපතිවරයකු;
(iv) කොමිෂන් සභාව විසින් පත්කරන ලද සාමාජිකයින් දෙදෙනෙකු;
(v) කොමිෂන් සභාව විසින් අවස්ථාවෝචිත පරිදි පත්කරන ලද ලේඛකාධිකාරීවරයකු/ මූල්‍යාධිකාරීවරයකු;
(vi) කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් නම් කොට කොමිෂන් සභාව විසින් පත්කරන ලද අදාල තනතුරට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් යුතු රාජ්‍ය නිලධරයකු;

සටහන:

ඉහත සඳහන් තනතුරුවල, තනතුරේ ස්ථිර කිරීමට අදාල තේරීම් කමිටුවක සංයුතිය පහත සඳහන් පරිදි විය යුතු ය;

i. ප්‍රධාන විධායක නිලධරයා, තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්;
ii. කොමිෂන් සභාව විසින්, පාලක බල මණ්ඩලයට පත්කරන ලද පාලක බල මණ්ඩල සාමාජිකයකු;
iii. අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ ලේකම්වරයා
iv. ප්‍රධාන විධායක නිලධරයා විසින් නම් කරනු ලබන කාර්ය මණ්ඩල

සාමාජිකයින් දෙදෙනෙකු. මෙයින් එක් සාමාජිකයකු අදාල දෙපාර්තමේන්තුවේ/ අංශයේ අංශාධිපතිවරයා විය යුතු ය.

(අදාල අංශාධිපති තනතුරේ අයදුම්කරුවකු වූ විට හෝ එම දෙපාර්තමේන්තුවේ/ අංශයේ නිත්‍ය අංශාධිපතිවරයා නොමැති විට, ප්‍රධාන විධායක නිලධරයා විසින් ඒ වෙනුවට සුදුසු තැනැත්තෙකු තේරීම් කමිටුවට නම් කරනු ඇත)

13. පනතෙහි X වන කොටසෙහි දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අනුව, එම පනතෙහි 71 (2) (ii) වගන්තියේ සඳහන් විධායක ශ්‍රේණියකට අයත් තනතුරක සෑම පත්කිරීමක්/ උසස් කිරීමක්ම සහ වැටුප් කේත U-MO යටතේ හඳුන්වා දී ඇති සෑම තනතුරකට ම (මෙහි ඉහත 12 (අ) යටතේ සහ අදාල බඳවා ගැනීමේ පරිපාටිවල නිශ්චිතවම දක්වා ඇත්නම් හැරෙන්නට) සෑම පත්කිරීමක්/ උසස් කිරීමක් ම මෙහි පහත දක්වා ඇති සංයුතියක් සහිත තේරීම් කමිටුවක් විසින් නිර්දේශ කරන ලදුව, එක් එක් ආයතනයේ පාලක බල මණ්ඩලයේ නිර්දේශයට අනුව, කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු ය.

(i) ප්‍රධාන විධායක නිලධරයා, තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්;
(ii) කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන එහි සාමාජිකයින් දෙදෙනෙකු
(iii) කොමිෂන් සභාවෙන් පාලක බල මණ්ඩලයට පත්කරනු ලැබූ පාලක බල මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු
(iv) අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා හෝ විශ්වවිද්‍යාල විද්‍යායතනයක ලේකම්වරයා
(v) ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් නම් කරනු ලබන කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු. මෙයින් එක් සාමාජිකයකු අදාල දෙපාර්තමේන්තුවේ/ අංශයේ, අංශ ප්‍රධානියා විය යුතු ය. (අදාල අංශාධිපති තනතුරේ අයදුම්කරුවකු වූ විට හෝ එම දෙපාර්තමේන්තුවේ / අංශයේ නිත්‍ය අංශාධිපතිවරයා නොමැති විට, ප්‍රධාන විධායක නිලධරයා විසින් ඒ වෙනුවට සුදුසු තැනැත්තෙකු තේරීම් කමිටුවට නම් කරනු ඇත).

සටහන:

ඉහත සඳහන් තනතුරක, තනතුරේ ස්ථිර කිරීම සඳහා වන තේරීම් කමිටුවේ සංයුතිය, ඉහත 13 හි (i), (iii), (iv) සහ (v) හි සඳහන් පරිදි විය යුතු ය.

14. පනතෙහි 37 (1) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි, විශ්වවිද්‍යාලයක පළමුවන ලේඛකාධිකාරීවරයා හැරෙන්නට ලේඛකාධිකාරී තන්තුරේ සෑම පත්වීමක් හෝ පනතෙහි 59 (1) වගන්තිය යටතේ දක්වා ඇති විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක ලේකම් තනතුරේ සෑම පත්වීමක් ම, පහත සඳහන් තැනැත්තාගෙන් සමන්විත තේරීම් කමිටුවක නිර්දේශය මත, එකී විශ්වවිද්‍යාලයේ හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ පාලක බල මණ්ඩලය විසින් සිදු කළ යුතු ය.

(i) ප්‍රධාන විධායක නිලධරයා, තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්;
(ii) කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන එහි සාමාජිකයින් දෙදෙනෙකු

(iii) කොමිෂන් සභාව විසින් අදාල පාලක බල මණ්ඩලයට පත්කරනු ලැබූ පාලක බල මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු

සටහන:

1. 14 වන උපඡේදයෙහි සඳහන් නියමයන්, *අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමට යටත්ව*, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී තනතුරට පත්කිරීම සඳහා ද අදාල වේ.

2. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ද ඇතුළුව, ඉහත සඳහන් තනතුරුවල, තනතුරේ ස්ථිර කිරීම සඳහාවන තේරීම් කමිටුව, ඉහත 14 වන උපඡේදයෙහි (i) සහ (iii) යටතේ දක්වා ඇති තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

15. පනතෙහි 38 (1) වගන්තියට අනුව, විශ්වවිද්‍යාලයක පළමුවන මූල්‍යාධිකාරීවරයා හැරෙන්නට මූල්‍යාධිකාරී තනතුරේ සෑම පත්වීමක් ම හෝ පනතෙහි 61 (1) වගන්තියට අනුව, විශ්වවිද්‍යාල විද්‍යායතනයක භාණ්ඩාගාරික තනතුර සඳහා වන සෑම පත්වීමක්ම පහතින් සඳහන් කොට ඇති තේරීම් කමිටුවේ නිර්දේශය මත අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාලයේ හෝ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයේ පාලක බල මණ්ඩලය විසින් සිදු කළ යුතු ය.

(i) ප්‍රධාන විධායක නිලධරයා, තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්;

(ii) කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන එහි සාමාජිකයකු

(iii) අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා හෝ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයේ ලේකම්වරයා

විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයකු නොසිටින අවස්ථාවක දී හෝ ලේඛකාධිකාරී තනතුර නොදරන, එහෙත් තනතුරේ වැඩ බැලීමට/ තනතුරේ රාජකාරී ඉටුකිරීමට ආදී වශයෙන් ලේඛකාධිකාරී තනතුරේ රාජකාරී ඉටුකිරීමට යම් නිලධරයකු කටයුතු කරන අවස්ථාවකදී, කොමිෂන් සභාව විසින් තේරීම් කමිටුව සඳහා වෙනත් විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරීවරයකු පත් කළ යුතු ය.

(iv) පාලක බල මණ්ඩලය විසින් පත්කරන ලද සාමාජිකයින් දෙදෙනෙකු.
මෙම සාමාජිකයින් දෙදෙනාගෙන් එක් තැනැත්තෙකු කොමිෂන් සභාව විසින් පාලක බල මණ්ඩලයට පත්කරන ලද සාමාජිකයන් අතුරින් විය යුතු අතර, අනෙක් සාමාජිකයා රජයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු විය යුතු ය.

එමෙන්ම, එසේ පත්කරන තැනැත්තන්ගෙන් එක් අයෙකු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CASL), කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ (CIMA) හෝ සහතිකලත් සංස්ථාපිත ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) සාමාජිකයෙකු විය යුතු ය.

සටහන:

1. ඉහත 15 වන උපඡේදයේ සඳහන් නියමයන්, *අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමට යටත්ව*, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරී තනතුරට පත්කිරීම සඳහා ද අදාල වේ.

2. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ද ඇතුළුව, ඉහත තනතුරේ ස්ථිර කිරීම මෙහි 15 වන උපඡේදයේ (i) සහ (iii) හි සඳහන් තේරීම් කමිටු සාමාජිකයින් සහ කොමිෂන් සභාව විසින්, අදාල පාලක බල මණ්ඩලය වෙත පත්කරන ලද, පාලක බල මණ්ඩල සාමාජිකයකුගෙන් සමන්විත තේරීම් කමිටුවක් විසින් සිදු කළ යුතු වේ.

16. පනතෙහි X වන කොටසෙහි දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අනුව, උසස් අධ්‍යාපන ආයතනයක, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ සෑම පත්කිරීමක්/ උසස් කිරීමක්ම පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත තේරීම් කමිටුවක නිර්දේශය මත, එම ආයතනයන්හි පාලක බල මණ්ඩලය විසින් සිදු කළ යුතු ය;

(i) ප්‍රධාන විධායක නිලධරයා, තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්;
(ii) සනාථන සභාව විසින් නම් කරනු ලබන පීඨයක පීඨාධිපතිවරයකු
(iii) කොමිෂන් සභාව විසින් පාලක බල මණ්ඩලය වෙත පත්කරන ලද සාමාජිකයින් අතුරින් තෝරා ගත්, පාලක බල මණ්ඩල සාමාජිකයකු
(iv) විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා/ විශ්වවිද්‍යාල විද්‍යායතනයක ලේකම්වරයා
(v) අදාල දෙපාර්තමේන්තුවේ / අංශයේ/ මධ්‍යස්ථානයේ/ ඒකකයේ අංශාධිපතිවරයා. අංශාධිපතිවරයකු නොමැති අවස්ථාවකදී ප්‍රධාන විධායක නිලධරයා විසින් නම් කරන ලද සුදුසු තැනැත්තෙකු

සටහන:

1. මෙහි උපඡේද 16 හි සඳහන් නියමයන්, *අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට යටත්ව*, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල තනතුරකට පත්කිරීම සඳහා ද අදාල වේ.

2. තනතුර පවතින්නේ ආයතනයක නම්, ඉහත සඳහන් තේරීම් කමිටුවේ (ii) සහ (iv) පහත සඳහන් ආකාරයෙන් වෙනස් විය යුතු ය;
(ii) ආයතනය අනුබද්ධිතව පවතින විශ්වවිද්‍යාලයේ පීඨයක පීඨාධිපතිවරයකු
(iv) ආයතනය අනුබද්ධිතව පවතින විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා

3. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ද ඇතුළුව, ඉහත සඳහන් තනතුරක, තනතුරේ ස්ථිර කිරීම සඳහා වන තේරීම් කමිටුව, මෙහි ඉහත 16 වන උප්ඡේදයෙහි සඳහන් පරිදි විය යුතු ය.

17. ඉහත සඳහන් ඡේදයෙහි විශේෂිතවම ප්‍රතිපාදන සලසා නොමැති, මෙම ක්‍රමවේදයන්හි 11,12,13,14,15 සහ 16 යන වගන්ති වලින් දක්වා ඇති තනතුරු හැරෙන්නට, අනෙකුත් අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරක සෑම පත්කිරීමක්/ උසස් කිරීමක් ම, එම උසස් අධ්‍යාපන ආයතනයන්හි පාලක බල මණ්ඩලය විසින් හෝ පනතෙහි 45 (2) (xii) වගන්තිය හෝ 1990 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල නියමාවලි අංක 1 හි 14 (2) ඡේදයෙහි (xi) උපඡේදයට අනුව මෙන්ම පනතෙහි 45 (2) (xii) වගන්ති සමඟ කියවිය යුතු 63 (3) වගන්තියේ සඳහන් පරිදි එම කටයුතු එහි ප්‍රධාන විධායක නිලධරයා හට බලය පවරා ඇති අවස්ථාවක දී, එකී ප්‍රධාන විධායක නිලධරයා විසින්, පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත තේරීම් කමිටුවක නිර්දේශය මත, අදාල පත්කිරීම්/ උසස් කිරීම් සිදු කළ යුතු ය.

(අ) විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා හෝ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයේ ලේකම්වරයා, තේරීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන්; සහ

(ආ) එම උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් පත්කරනු ලබන එහි ස්ථිර කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු.

සටහන :

ආයතනයක් විෂයයෙහි නම්, තේරීම් කමිටුව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය;

(අ ) ආයතනයේ අධ්‍යක්ෂවරයා

(ආ) ආයතනයේ පාලක බල මණ්ඩලය විසින් පත්කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු. මෙයින් එක් සාමාජිකයකු, ආයතනය අනුබද්ධිතව පවත්නා විශ්වවිද්‍යාලයේ පරිපාලන කාර්ය මණ්ඩලයෙන් විය යුතු ය.

18. යම් විශේෂිත හේතූන් මත, කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක තනතුරකට පත්කිරීම හෝ තනතුරක යම් ශ්‍රේණියකට හෝ පන්තියකට උසස් කිරීම සඳහා මෙම නියමාවලියේ සඳහන් කොට ඇති ආකාරයට තේරීම් කමිටුවක් ස්ථාපනය කිරීම අපහසු යැයි, කොමිෂන් සභාව සෑහීමකට පත්වන්නේ නම්, එවැනි තේරීම් කමිටුවක සංයුතිය, සිය සභා සම්මතයෙන් කොමිෂන් සභාවට වෙනස් කළ හැකි ය.

19. පත්කිරීම්/ තනතුරේ ස්ථිර කිරීම්/ උසස් කිරීම් ආදිය සඳහා අදාල වන්නා වූ චක්‍රලේඛ උපදෙස්, කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි ය. පත්කිරීමකට/ තනතුරේ ස්ථිර කිරීමකට/ උසස් කිරීමකට අදාල ව කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් සහ අදාල බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් ක්‍රමවේදයන් ද, නියමිත පරිදි මෙන් ම අනලස්ව පිළිපැදීමට එකී පත්කිරීම්/ තනතුරේ ස්ථිර කිරීම්/ උසස් කිරීම් සිදු කරන්නාවූ තේරීම් කමිටු සහ අනුමත කරන්නාවූ පත්කිරීමේ බලධරයින් වගබලා ගත යුතු වේ.

20. යම් තනතුරක් සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට පෙර, ඒ සඳහා සම්පාදනය කරන ලද "ලකුණු ලබා දීමේ ක්‍රමවේදය" (Marking Scheme) අදාල පරිදි කොමිෂන් සභාවෙන්/ පාලක බල මණ්ඩලයෙන් අනුමත කරවා ගත යුතු ය. එසේ සම්පාදනය කරන ලද "ලකුණු ලබාදීමේ ක්‍රමවේදය" විශ්වවිද්‍යාල පද්ධතියේ සෑම තනතුරක් සඳහාම භාවිතා කළ යුතු වේ.

21. කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක යම් තනතුරක පත්වීම සඳහා, තනතුරේ ස්ථිර වීම සඳහා හෝ උසස්වීමක් සඳහා අයදුම්කොට ඇති අයදුම්කරුවකු/ අයදුම්කරුවන්, අදාල තේරීම් කමිටුවේ නිගමනයට අනුව, විශේෂිත දැනුමක්, යෝග්‍යතාවයක්, හැකියාවක් දැක්විය යුතු යැයි තීරණය කළ විට, එම අයදුම්කරු/ අයදුම්කරුවන්ගේ එකී හැකියාවන් පරීක්ෂා කිරීම සඳහා ආයතනය තුලින්ම හෝ ආයතනයට බාහිරින් වූ සුදුසු තැනැත්තෙකු/ තැනැත්තන්ගේ සේවය ලබා ගැනීමට එකී තේරීම් කමිටුවට අවකාශය තිබේ. එසේ සේවය ලබා ගන්නා තැනැත්තන් හට, අදාල තේරීම් කමිටුවක නිරීක්ෂකයකු වශයෙන් සහභාගි විය හැකි අතර, ඔහුට එකී තේරීම් කමිටුවේදී සිය ඡන්දය භාවිතා කිරීමට හෝ තේරීම් කමිටු නිර්දේශයන්ට සහ එහි අවසන් තීරණවලට අත්සන් කිරීමේ අයිතියක් නොමැත.

22. පවතින තනතුරු සංඛ්‍යාවට සරිලන, නියමිත සුදුසුකම්වලින් යුතු අයදුම්කරුවන් සිටින සෑම අවස්ථාවකදී ම, තේරීම් කමිටුව විසින් පත්කිරීමක්/ උසස් කිරීමක් සඳහා පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් තෝරාගත යුතු ය. පත්කිරීමක දී නම්, පුරප්පාඩු සංඛ්‍යාවට වඩා සුදුසු අයදුම්කරුවන් සිටීනම්, එම අයදුම්කරුවන් අතුරින් එක් අයෙකු හෝ එක් අයෙකුට වැඩි ප්‍රමාණයක් පොරොත්තු ලේඛනගත කොට තැබිය හැකි ය. පත්කිරීම් සඳහා නිර්දේශ කරන ලද සහ පොරොත්තු ලේඛනයේ තැබීමට නිර්දේශ කරන ලද අයදුම්කරුවන්, ඔවුන් ලබාගත් ලකුණු පදනම් කොට ගෙන එම අනුපිළිවෙලට අනුව කුසලතා ලැයිස්තුවක ස්ථාන ගත කළ යුතු වේ.

පොරොත්තු ලේඛනයට ඇතුලත් නොකළ අයදුම්කරුවකු, එම තේරීම් කමිටු නිර්දේශයන්ට අනතුරුව සිදුකරන්නා වූ පත්කිරීමක් සඳහා සලකා බැලීම නොකළ යුතු ය.

23. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/ මහාචාර්ය/ සහාය මහාචාර්ය සහ පුස්තකාලයාධිපති තනතුරු සඳහා ප්‍රසිද්ධ කරන ලද දැන්වීමකට ප්‍රතිචාර වශයෙන්, ඉදිරිපත් කළ අයදුම්පත්, එකී අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනයේ සිට වසර එකහමාරක (1 ½) කාලයක් සඳහා වලංගු වේ. අනෙකුත් සියළු තනතුරු සඳහා එම වලංගු කාලය, අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයේ සිට එක් වසරක (01) කාලයකි. සෑම උසස් අධ්‍යාපන ආයතනයක්ම/ විද්‍යායතනයක්ම, ඉහතින් සඳහන් කොට ඇති කාල සීමාවක් තුල දී නියමිත තේරීම් කමිටු විසින් සම්පාදනය කරන ලද තේරීම්, අදාල පාලක බල මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය. කෙසේ වුවද, පාලක බල මණ්ඩලය විසින් යම් තෝරා ගැනීමක් අනුමත කිරීමට ගත කරන්නා වූ කාලය, ඉහතින් දක්වා ඇති වලංගුකාලයට ඇතුලත් නොවේ.

24. යම් තනතුරකට පත්කිරීම සඳහා, තේරීම් කමිටුවක් විසින් තම නිර්දේශයන් ඉදිරිපත් කළ විට, එහි නිර්දේශය අදාල පාලක බල මණ්ඩලය විසින් අනුමත කරන ලද දිනයේ සිට මාස හයක (06) කාලයක් සඳහා වලංගු වනු ඇත.

25. තේරීම් කමිටුවක් විසින් යම් තනතුරකට පත්කිරීම් සඳහා, එක් අයදුම්කරුවකු හෝ එයට වැඩි අයදුම්කරුවන් ප්‍රමාණයක් මෙහි ඉහත 22 වන ඡේදයෙහි දක්වා ඇති පරිදි පොරොත්තු ලේඛනයෙහි තැබූ විට, එකී නිර්දේශය පාලක බල මණ්ඩලය විසින් අනුමත කළ දිනයේ සිට මාස හයක (06) කාලයක් ඇතුලත දී, ඇතිවන්නා වූ තනතුරක/ තනතුරුවල පුරප්පාඩුවක් හෝ පුරප්පාඩු, තනතුරු සඳහා නැවත වරක් අයදුම්පත් කැඳවීමකින් තොරව, එම පොරොත්තු ලේඛනයේ තබා ඇති අයදුම්කරුවන්ගෙන් පිරවිය යුතු ය.

එසේ සිදුකරන්නා වූ සියළුම පත්කිරීම්, තනතුරු සඳහා පවත්වන ලද තේරීම් කමිටුව විසින් තීරණය කළ පරිදි, එකී අයදුම්කරුවන්ගේ කුසලතා ලකුණු මට්ටම පාදක කරගෙන සිදු කළ යුතු වේ.

26. (1) මෙහි පහත සඳහන් (2) ඡේදයෙහි නියමයන්ට යටත්ව, යම් උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක තනතුරක් සඳහා සිදු කරන්නා වූ සෑම පත්කිරීමක්, ශ්‍රේණියකට/ පන්තියකට උසස් කිරීමක්, එකී ආයතනයන්හි පාලක බල මණ්ඩලය විසින් පත්කිරීම්/ උසස් කිරීම් අනුමත කරන තෙක්, කිසිදු තැනැත්තෙකු හට පත්කිරීමේ ලිපියක් හෝ උසස් කිරීමේ ලිපියක් නිකුත් නොකළ යුතු අතර, පනතෙහි 45 (2) (xii) වගන්තිය හෝ 1990 අංක 01 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය නියමාවලියෙහි 14 (2) උපඡේදයෙහි සඳහන් පරිදි හෝ පනතෙහි 45 (2) (xii)

වගන්තිය සමඟ කියවිය යුතු එහි 63 (3) වගන්තියෙහි සඳහන් ආකාරයට හෝ තනතුරක පත්කිරීමේ බලය, එකී ආයතනයන්හි ප්‍රධාන විධායක නිලධරයාට පවරා දී ඇති විටක, එකී ප්‍රධාන විධායක නිලධරයාගේ නිසි අනුමැතියකින් තොරව කිසිදු තැනැත්තෙකු හට පත්වීමේ ලිපියක් නිකුත් නොකළ යුතු ය.

(2) යම් තැනැත්තෙකු තනතුරකට පත්කිරීමේ බලය, ඉහත උපඡේදයෙහි සඳහන් පරිදි, පනත මඟින් හෝ නියමාවලියක් මඟින් පවරා දී ඇති අවස්ථාවන්හිදී, එම පත්කිරීම සිදු කරන ලද දිනයට පසුව පැවැත්වන්නා වූ පළමු පාලක බල මණ්ඩල රැස්වීමට, අදාල ප්‍රධාන විධායක නිලධරයා විසින්, එම පත්වීම සම්බන්ධයෙන් වාර්තා කළ යුතු වේ.

27. යම් තැනැත්තෙකු තනතුරකට පත්කරමින් නිකුත් කරන්නා වූ සෑම පත්වීමේ ලිපියකම හෝ යම් තැනැත්තෙකු හට නිකුත් කරන්නා වූ සෑම උසස් කිරීමේ ලිපියකම, එකී පත්වීම හෝ උසස් වීම පනතෙහි 86 වන වගන්තියට අනුව, විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය විසින් සමාලෝචනය කිරීමට යටත්වන බවට සඳහන් ප්‍රකාශයක් ද ඇතුලත් කළ යුතු ය.

28. ආචර්යවරයකු වශයෙන් පත්කල තනතුරක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි/ විද්‍යායතනයන්හි ආයතන සංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ 1.1 උපඡේදයන්හි සඳහන් ප්‍රතිපාදනයන්ට අදාල තනතුරු දරන්නන් හැරෙන්නට, අනෙකුත් තැනැත්තන් හට නිකුත් කරනු ලබන සෑම පත්වීමේ ලිපියකටම හෝ එකී තැනැත්තෙකු කිසියම් තනතුරක , ශ්‍රේණියක හෝ පන්තියකට උසස් කිරීමේ ලිපියකම ඔවුන් පනතෙහි 78 වන වගන්තිය ප්‍රකාරව ස්ථාන මාරුකිරීමට යටත්වන බව දැක්වෙන ප්‍රකාශයක් ඇතුලත් කළ යුතු ය.

29. යම් තැනැත්තෙකු කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක, තනතුරකට පත්කළ විට හෝ තැනැත්තෙකු තනතුරක ශ්‍රේණියකට හෝ පන්තියකට උසස් කළ විට, එම තැනැත්තාගේ වැටුප, කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි/ විද්‍යායතනයන්හි ආයතන සංග්‍රහයේ VI වන පරිච්ඡේදයේ 3,6,13,14,15,17,21 සහ 26 ඡේදයන්හි සඳහන් නියමයන්ට අනුව තීරණය කළ යුතු වේ.

30. මෙම නියමාවලියෙහි –

"පනත" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ එහි සංශෝධන අදහස් වේ;

"කොමිෂන් සභාව" යන්නෙන්, ඉහත සඳහන් පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ;

පහත සඳහන් ආයතනයන්හි " පාලක බල මණ්ඩලය" යන්නට:

(i) විශ්වවිද්‍යාලයක් නම්, එහි පාලක සභාව;

(ii) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නම්, එහි පාලක සභාව;

සහ

(iii) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් නම්, එහි කළමනාකරණ මණ්ඩලය

උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක/ ආයතනයක නම්, එම ආයතනයන්හි පාලක බල මණ්ඩල, එකී ආයතන පිහිටුවමින් නිකුත්කොට ඇති නියමාවලියෙහි සඳහන් පරිදි වේ.

උසස් අධ්‍යාපන ආයතනයන් (Higher Educational Institution) වශයෙන් ගත්කල, එම නිර්වචනයට විශ්වවිද්‍යාලයක්, මණ්ඩපයක්, විවෘත විශ්වවිද්‍යාලයක්, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් හෝ විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත කොට ඇති හෝ ස්ථාපිත කිරීමට නියමිත උසස් අධ්‍යාපනය සඳහා වූ මධ්‍යස්ථානයක් ද ඇතුලත් වේ.

"උසස් අධ්‍යාපනික ආයතන" (Higher Educational Institute) යන්නෙන්, විශ්වවිද්‍යාල පනතෙහි 24 A සහ 24 B යන වගන්ති යටතේ පිහිටුවා ඇති හෝ පිහිටුවීමට නියමිත උසස් අධ්‍යාපනික ආයතනයන් අදහස් වේ.

"ප්‍රධාන විධායක නිලධරයා":

(i) විශ්වවිද්‍යාලයක නම්, එම විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා;
(ii) විවෘත විශ්වවිද්‍යාලයක නම්, එම විවෘත විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා;
(iii) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් නම්, එම විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා;
(iv) උසස් අධ්‍යාපන සඳහා වූ මධ්‍යස්ථානයක්/ ආයතනයක් නම්, ඒවායේ අධ්‍යක්ෂවරුන් අදහස් වේ.

"ආචාර්යවරයා" යන්නට ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය, කථිකාචාර්ය (තනතුරේ ස්ථිර නොවූ) සහ කථිකාචාර්ය (පරිවාස) යන තැනැත්තන්ද, යම් නියමාවලියක් මඟින් කිසියම් තනතුරක් දරන්නකු ආචර්යවරයකු ලෙස ප්‍රකාශයට පත්කොට ඇත්නම්, එම තැනැත්තන් ද ඇතුලත් වේ. පත්කිරීමේ අවශ්‍යතාවයන් සඳහා ආචාර්යවරයා යන්නට පනතෙහි 79 වන වගන්තියෙහි දක්වා ඇති පරිදි පුස්තකාලයාධිපතිවරයකු/ නියෝජ්‍ය පුස්තකාලයාධිපතිවරයකු, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයකු සහ සහකාර පුස්තකාලයාධිපතිවරයකු ද ඇතුලත් වේ.

"පරිපාලන කාර්ය මණ්ඩල" තනතුරක් යන්නට පහත සඳහන් තනතුරු ඇතුලත් වේ;

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා,
විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරීවරයා/විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අතිරේක ලේකම්වරයා,
විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක ලේකම්වරයකු,
නියෝජ්‍ය ලේකම්/ නියෝජ්‍ය ලේඛකාධිකාරී,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
සහකාර ලේකම්/ සහකාර ලේඛකාධිකාරී,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන ගණකාධිකාරී/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරීවරයා/ විශ්වවිද්‍යාලයක මූල්‍යාධිකාරීවරයා/ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක භාණ්ඩාගාරිකවරයා,
නියෝජ්‍ය ගණකාධිකාරී/ නියෝජ්‍ය මූල්‍යාධිකාරී/ නියෝජ්‍ය භාණ්ඩාගාරික/ නියෝජ්‍ය අභ්‍යන්තර විගණක,
ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී/ජ්‍යෙෂ්ඨ සහකාර භාණ්ඩාගාරික/ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක,

සහකාර ගණකාධිකාරී/ සහකාර මූල්‍යාධිකාරී/ සහකාර භාණ්ඩාගාරික/ සහකාර අභ්‍යන්තර විගණක,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අතිරේක ලේකම් (නීති හා ප්‍රලේඛන),
නියෝජ්‍ය ලේකම්/ නියෝජ්‍ය ලේඛකාධිකාරී (නීති හා ප්‍රලේඛන),
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (නීති හා ප්‍රලේඛන),
සහකාර ලේකම්/ සහකාර ලේඛකාධිකාරී (නීති හා ප්‍රලේඛන),
නියෝජ්‍ය ලේඛකාධිකාරී (පුස්තකාල සේවා),
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවා),
සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවා),

ඉහත සඳහන් තනතුරු "පරිපාලන තනතුරු " ලෙස හඳුන්වා ඇත්තේ, එම තනතුරු සඳහා බඳවාගැනීමට අදාල විශේෂිත සුදුසුකම් සලකා බැලීමෙන් අනතුරුව සහ එම තනතුරු දරන්නන් විසින් ඉටුකරන්නා වූ රාජකාරි ස්වභාවය මෙන්ම එක් එක් තනතුරට අදාලව පවතින්නා වූ වගකීම් සහ වගවීමේ ස්වභාවය ද සැලකිල්ලට ගැනීමෙණි.